2023
දෙසැම්බර්

# ශ්‍රී ලංකා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය

නිෂ්පාදන සහ සේවා

STATISTICS DEPARTMENT
CENTRAL BANK OF SRI LANKA


## නිෂ්පාදන සහ සේවා අංශවල ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක 2023 දෙසැම්බර් මාසයේ දී ඉහළ ගියේ ය

**නිෂ්පාදන ක්‍රියාකාරකම්හි වර්ධනයක් පිළිබිඹු කරමින්, නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමණාකරුවන්ගේ දර්ශකය 2023 දෙසැම්බර් මාසයේ දී දර්ශකාංක 52.7 ක් ලෙස වාර්තා කරන ලදී.** මෙම වර්ධනය සඳහා සේවා නියුක්තිය උප-දර්ශකය හැර අනෙකුත් සියලුම උප-දර්ශකයන්ගේ දක්නට ලැබුණු ඉහළ යෑම හේතු විය.

නව ඇණවුම් සහ නිෂ්පාදන ඉහළ යෑම සඳහා ආහාර හා පාන වර්ග නිෂ්පාදන අංශය ප්‍රධාන වශයෙන් දායක වූ අතර, ඒ සඳහා උත්සව සමයේ ඉල්ලුම ඉහළ යෑම හේතු විය. එසේ වුවද, මෙම මාසයේ දී රෙදිපිළි හා ඇඟලුම් නිෂ්පාදන අංශයේ නව ඇණවුම් සහ නිෂ්පාදන පහළ ගිය අතර එය සේවා නියුක්තියේ පහත වැටීමට ද ප්‍රධාන වශයෙන් දායක විය. මේ අතර, මෙම මාසයේ දී තොග මිලදී ගැනුම් ඉහළ ගිය අතර, ඒ සඳහා නිෂ්පාදන සහ නව ඇණවුම් ඉහළ යාම හේතු විය. තවද, ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය දෙසැම්බර් මාසයේදී තවදුරටත් වැඩි විය.

**නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය**
**52.7**
**2023 දෙසැම්බර්**

නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

| විචලයය | නොවැ. | දෙසැ. | +/- | සාරාංශය |
|---|---|---|---|---|
| **ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** | **57.0** | **52.7** | **-** | **අඩු වේගයකින් ඉහළ යෑමක්** |
| **උප-දර්ශක** | | | | |
| නව ඇණවුම් | 60.5 | 56.0 | - | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| නිෂ්පාදන | 59.5 | 53.0 | - | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| සේවා නියුක්තිය | 51.5 | 42.5 | - | ඉහළ යෑමක සිට පහළ යෑමක් |
| තොග මිලදී ගැනුම් | 59.5 | 59.5 | = | එකම මට්ටමෙන් වැඩි වීමක් |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | 51.5 | 54.5 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

ඉදිරි මාස තුන තුළ නිෂ්පාදන කටයුතු සඳහා වූ අපේක්ෂාවන් යහපත් මට්ටමක පවතියි. එසේ වුවද, 2024 ජනවාරි සිට ක්‍රියාත්මකවන බදු සංශෝධනයේ බලපෑම සහ රතු මුහුදේ පවතින නොසන්සුන්තාව හේතුවෙන් නැව් ගමනාගමනයට සිදුවන බාධා පිළිබඳව සමාගම් සැලකිලිමත් වේ.

### ගෝලීය ප්‍රවණතා: නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය

නිෂ්පාදන අංශයෙහි ගෝලීය ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය, 2023 නොවැම්බර් මාසයට සාපේක්ෂව දර්ශකාංක 0.3කින් පහළ යමින් 2023 දෙසැම්බර් මාසයේ දී 49.0ක දර්ශක අගයක් වාර්තා කරන ලදී.

චීනය සහ රුසියාව යන රටවල පසුගිය මාසයට සාපේක්ෂව 2023 දෙසැම්බර් මාසයේ දී ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක වැඩි වේගයකින් ද ඉන්දියාව සහ සිංගප්පූරුව යන රටවල අඩු වේගයකින්ද වර්ධනය විය. එසේ වුවද, යුරෝපා කලාපය, එක්සත් රාජධානිය සහ එක්සත් ජනපදය යන රටවල ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක පසුගිය මාසයට සාපේක්ෂව 2023 දෙසැම්බර් මාසයේ දී පහළ යන ලදී.

*මූලාශ්‍රය: එස්&පී ග්ලෝබල් (S&P Global)[1] ආයතනය, 2024 ජනවාරි 12 වන දිනට*

[1] *එස්&පී ග්ලෝබල්* (S&P Global) *ජාත්‍යන්තරව ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය සම්පාදනය කරන ප්‍රධාන ආයතනයක් වන අතර, ආර්ථිකයන් 40 කට අධික ප්‍රමාණයක් සඳහා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය සම්පාදනය කරනු ලබයි.*

**සේවා ක්‍රියාකාරකම්හි වර්ධනයක් පෙන්නුම් කරමින්, සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 2023 දෙසැම්බර් මාසයේ දී දර්ශකාංක 58.9ක් වාර්තා කළේය.** මේ සඳහා නව ව්‍යාපාර, ව්‍යාපාර ක්‍රියාකාරකම් සහ අපේක්ෂිත ව්‍යාපාර ක්‍රියාකාරකම්හි සිදු වූ ඉහළ යෑම් හේතු විය.

සේවා අංශයේ නව ව්‍යාපාර පිළිබඳව සලකා බැලීමේ දී, ප්‍රධාන වශයෙන්, තොග සහ සිල්ලර වෙළඳාම, මූල්‍ය සේවා, රක්ෂණ, අනෙකුත් පෞද්ගලික සේවා කටයුතු සහ නවාතැන් හා ආහාරපාන සැපයීමේ සේවා යන උප අංශවල දක්නට ලැබුණු ඉහළ යෑම් සමඟ, 2023 නොවැම්බර් මාසයට සාපේක්ෂව 2023 දෙසැම්බර් මාසයේ දී නව ව්‍යාපාර ඉහළ ගියේය.

බොහෝ උප අංශවල දක්නට ලැබුණු ධනාත්මක වර්ධනයත් සමඟ, 2023 දෙසැම්බර් මාසයේ දී ව්‍යාපාර ක්‍රියාකාරකම් වැඩි වේගයකින් අඛණ්ඩව ඉහළ ගියේය. ඒ අනුව, උත්සව සමය හා නිවාඩු පැවතීම මෙන්ම වසර තුළ ඉහළම සංචාරක පැමිණීම් දෙසැම්බර් මාසයේ දී වාර්තා වීම හේතුවෙන් අනෙකුත් පෞද්ගලික සේවා කටයුතු, ප්‍රවාහන සහ නවාතැන් හා ආහාරපාන සැපයීමේ සේවා යන උප අංශවලට අදාළ ව්‍යාපාර ක්‍රියාකාරකම්වල සැලකිය යුතු වර්ධනයක් දක්නට ලැබුණි. එමෙන්ම, උත්සව සමයේ සිදු වූ වෙළඳාම් කටයුතු හේතුවෙන් තොග සහ සිල්ලර වෙළඳාම උප අංශය ද ඉහළ වර්ධනයක් පෙන්නුම් කළේය. මේ අතර, ණය ලබා දීම් ඉහළ යෑමට අනුකූලව මූල්‍ය සේවා ද තවදුරටත් වර්ධනය විය.

සෘතුමය ඉල්ලුම සපුරාලීමට නව බඳවා ගැනීම් සිදු කළ නමුත් සේවා නියුක්තිය 2023 දෙසැම්බර් මාසයේ දී පහළ ගිය අතර, නිමකිරීමට නියමිත කාර්යයන් ද අඛණ්ඩව පහළ ගියේය.

| විචල්‍යය | නොවැ. | දෙසැ. | +/- | සාරාංශය |
|---|---|---|---|---|
| **ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** | **59.4** | **58.9** | **-** | **අඩු වේගයකින් ඉහළ යෑමක්** |
| | | **උප-දර්ශක** | | |
| නව ව්‍යාපාර | 57.6 | 64.5 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| ව්‍යාපාර ක්‍රියාකාරකම් | 63.6 | 71.0 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| සේවා නියුක්තිය | 58.5 | 46.5 | - | ඉහළ යෑමක සිට පහළ යෑමක් |
| නිමකිරීමට නියමිත කාර්යයන් | 45.6 | 48.3 | + | අඩු වේගයකින් පහළ යෑමක් |
| අපේක්ෂිත ඉදිරි ව්‍යාපාර ක්‍රියාකාරකම් | 71.7 | 64.1 | - | අඩු වේගයකින් ඉහළ යෑමක් |


මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

වැට් බදු සංශෝධන සහ ඒ අනුව ඉන්ධන හා උපයෝගිතා පිරිවැය ඉහළ යෑම වැනි අහිතකර බලපෑම් මධ්‍යයේ වුවද, ඉදිරි මාස තුන සඳහා ව්‍යාපාර ක්‍රියාකාරකම් පිළිබඳ අපේක්ෂාවන්, 2023 දෙසැම්බර් මාසයේ දී අඩු වේගයකින් නමුත් අඛණ්ඩව ඉහළ ගියේය.

**සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක අගය** **58.9**

**2023 දෙසැම්බර්**

සේවා අංශයෙහි
ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

### ගෝලීය ප්‍රවණතා: සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය

ගෝලීය සේවා ක්‍රියාකාරකම්හි ඉහළ යෑමක් පෙන්නුම් කරමින්, ගෝලීය සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 2023 දෙසැම්බර් මාසයේ දී 51.6ක් වාර්තා කළේය.

චීනය, ඉන්දියාව, ඇමරිකා එක්සත් ජනපදය, එක්සත් රාජධානිය සහ ජපානය යන රටවල සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක අනුව එම රටවල සේවා අංශය පසුගිය මාසයට සාපේක්ෂව 2023 දෙසැම්බර් මාසයේ දී වර්ධනයක් පෙන්නුම් කළේය.

*මූලාශ්‍රය: එස්&පී ග්ලෝබල් (S&P Global)[1] ආයතනය, 2024 ජනවාරි 16 වන දිනට*

***තාක්ෂණික සටහන:***

**දර්ශකය**

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 0 සිට 100 අතර අගයන් පරාසයක විහිදී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට සමාන නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී නොවෙනස්ව පැවතී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා වැඩි නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී වර්ධනයක් පෙන්නුම් කරයි.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා අඩු නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී සංකෝචනයට ලක්වී ඇති බව පෙන්නුම් කරයි.

**නියැදිය**

මෙම සමීක්ෂණයෙහි නියැදි රාමුව සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවෙන් ලබාගන්නා ලද බස්නාහිර පළාතෙහි ස්ථානගත වී ඇති විශාල සමාගම් මත පදනම් වී ඇත. දළ දේශීය නිෂ්පාදිතයට දක්වන ආංශික දායකත්වය පදනම් කර ගනිමින් නිෂ්පාදන සහ සේවා කටයුතු සඳහා මාසිකව ප්‍රතිචාර 100 බැගින් වූ ඉලක්කයක් පවත්වාගෙන යනු ඇත.

**විචල්‍යයන්ගේ අර්ථ නිරූපණයන්**

සේවා නියුක්තිය : සමාගම සඳහා සේවය ලබාදෙන සේවකයන් ගණන

ගැනුම් තොගය : නිෂ්පාදනය සඳහා යොදාගැනීමේ අරමුණින් මිල දී ගෙන ගබඩාවෙහි තබා ඇති අමුද්‍රව්‍ය

ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය : සැපයුම්කරුවෙකුට ඇණවුමක් ලබාදීමෙන් පසු එය කර්මාන්ත ශාලාවට ලැබීමට ගතවන කාලය

නිමකිරීමට නියමිත කාර්යයන් : නිම කිරීමට නොහැකි වූ ඇණවුම්

අනෙකුත් විචල්‍යයන් ඒවා නම් කිරීම සඳහා යොදා ඇති වචනාර්ථයෙන්ම පැහැදිලි වේ.